Sinhalese

# ඇදුම ප්‍රථමාධාර පිළිබඳ පියවර 4



## 1

පුද්ගලයා කෙලින් වාඩිකරවන්න.



## 2

නිල්/අළු සහන පෆරයෙන් (reliever puffer) සුළං පහර 4ක් ලබාදෙන්න

- පෆරය සොලවන්න
- 1 සුළං පහරක් ස්පේසරයට (spacer) දමන්න
- ස්පේසරයෙන් හුස්ම 4ක් ගන්න

සුළං පහර 4ක් ගන්නා තෙක් නැවත නැවත මෙසේ කරන්න

මතක තබාගන්න : **සොලවන්න, 1 සුළං පහරක් , හුස්ම 4ක්**

එසේ නැත්නම් **Bricanyl** ඉන්හේලරයෙන් මාත්‍රා 2ක් (වයස 6 සහ ඉහළට) හෝ **Symbicort** ඉන්හේලරයෙන් මාත්‍රා 2ක් (12ට වැඩි අයට)




## 3

මිනිත්තු 4ක් ඉන්න

සුවයක් නැත්නම් පහත සඳහන් කළ පරිදි **නිල්/අළු සහන පෆරයෙන් (reliever puffer) තවත් සුළං පහර 4ක්** ලබාදෙන්න

එසේ නැත්නම් Bricanyl ඉන්හේලරයෙන් හෝ Symbicort ඉන්හේලරයෙන් මාත්‍රා 1ක් දෙන්න




## 4

තවමත් සුවයක් නැත්නම් 000 අමතා ගිලන් රථයක් කැඳවන්න

හදිසි අනතුරු ආධාර පැමිණෙන තෙක් සෑම මිනිත්තු 4කටම වරක් සුළං පහර 4 බැගින් දෙන්න

එසේ නැත්නම් සෑම සෑම මිනිත්තු 4කටම වරක් **Bricanyl** ඉන්හේලරයෙන් හෝ **Symbicort** ඉන්හේලරයෙන් මාත්‍රා 1ක් දෙන්න **Symbicort** මාත්‍රා 3ක් දක්වා

වහාම හදිසි අනතුරු ආධාර අමතන්න. පහත අවස්ථාවලදී 000 අමතන්න :

- පුද්ගලයා හුස්ම නොගනී නම්.
- පුද්ගලයාගේ ඇදුම ඉක්මනින් නරක අතට හැරේ හෝ හොඳ අතට නොහැරෙන්නේ නම්.
- පුද්ගලයාට ඇදුම ප්‍රහාරයක් ඇතිවන අතර සහන ඉන්හේලරයක් ළඟ නැත්නම්.
- මේ ඇදුම බව ඔබට නිශ්චිත නැත්නම්
- පුද්ගලයා දරුණු අසාත්මික ප්‍රතික්‍රියා දක්වන කෙනෙක් බව ඔබ දන්නවා නම් - ඔවුන්ගේ දරුණු අසාත්මික ප්‍රතික්‍රියා සැලසුම ක්‍රියාත්මක කරන්න. ඉන් පසු ඇදුම ප්‍රථමාධාර ලබාදෙන්න. පුද්ගලයාට ඇදුම සැදී නොතිබුනද, නිල්/අළු සහන පෆර බෙහෙතෙන් හානියක් සිදු නොවේ.

මේ පරාග සමයේදී ඔබ ප්‍රවේසම් වන්න.

ඇදුම සහ අසාත්මිකතා කළමනාකරනය කරගැනීම වැදගත්ය.

වැඩි තොරතුරු සඳහා betterhealth.vic.gov.au වෙත යන්න. නැත්නම් 1800 ASTHMA (1800 278 462) අමතන්න

අනුමැතිය සහ ප්‍රකාශය වික්ටෝරියානු ආණ්ඩුව 1 Treasury Place, Melbourne (1708025) විසිනි.
© වික්ටෝරියානු ප්‍රාන්තය (Department of Health and Human Services). ලාංඡනය හැර, අන්තර්ගතය CC BY International 4.0 බලපත්‍රයකට යටත් වේ.

ASTHMA AUSTRALIA

VICTORIA State Government